සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙවන වාර පරීක්ෂණය 2018

07 ශ්‍රේණිය

## ක්‍රිස්තු ධර්මය

කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

### I කොටස

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. සෙකරියස් සහ එළිසබෙත්ගේ පුත්‍රයා වන්නේ,

(1) මොසෙස් ය. (2) සාමුවෙල් ය.

(3) ස්නාවක ජොහන් ය. (4) පේදුරු ය.

02. "නිවුන් දරුවා" යන නාමයෙන් හඳුන්වනු ලබන්නේ,

(1) මතෙව් ය. (2) තෝමස් ය. (3) ජොහාන් ය. (4) ජුදස් ය.

03. "ස්වාමීනි මාගේ පාද පමණක් නොව අත් ද හිස ද සේදුව මැනවැ යි" ප්‍රකාශ කළේ,

(1) පේදුරු ය. (2) ඇන්ඩෘ ය. (3) ජාකොබ් ය. (4) ජුදස් ය.

04. ජේසුස් වහන්සේ කුරුසියේ දී ප්‍රකාශ කළ වදන් ගණන වන්නේ,

(1) 3 කි. (2) 7 කි. (3) 5 කි. (4) 10 කි.

05. ගෝලයින්ට ශුද්ධාත්ම බලය ලැබුනේ,

(1) මහ සිකුරාදා දිනයේ ය. (2) මහ බ්‍රහස්පතින්දා දිනයේ ය.

(3) පෙන්තකොස්ත දිනයේ ය. (4) පාස්කු දිනයේ ය.

- අංක 06 සිට 10 දක්වා දැක්වෙන ප්‍රකාශ හරි නම් (✓) ලකුණද, වැරදි නම් (X) ලකුණද යොදන්න.

06. "රන්වත් රිදීවත් මට නැත. එහෙත් මට ඇති දේ ඔබට දෙමි" යි ප්‍රකාශ කළේ ජේසුස් වහන්සේ ය. ( )

07. ජේසුස් වහන්සේ තම මව වූ මරියා භාර දුන්නේ ජොහාන් නම් ගෝලයාට ය. ( )

08. ජේසුස් වහන්සේ කුරුසිපත් වීමට ආසන්න ම සිදු වීමකි ගෝලයන්ගේ පාද සේදීම. ( )

09. "ගල් පාන් බවට පත් කිරීම" ජේසු තුමාට පැමිනි තුන්වන පරීක්ෂාවයි. ( )

10. මුල් කුතුනු සභාවේ වැදගත්ම ලක්ෂණය යාච්ඤාවයි. ( )

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්නවලට A කොටසේ දැක්වෙන වගන්ති හා ගැළපෙන නිවැරදි පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| | A | B |
|---|---|---|
| 11. | පවුලේ නිර්මාතෘවරයා වන්නේ | තෝමස් ය. |
| 12. | ජේසුස් වහන්සේගේ උත්ථානය විශ්වාස නොකළේ | සියල්ල නිම විය. |
| 13. | මුල් කිතුනු සභාවේ ලක්ෂණයකි. | දෙවියන් වහන්සේ |
| 14. | පෙන්තකොස්ත දිනය පිළිබඳ කරුණු දක්වන්නේ | රොටි කැඩීම. |
| 15. | කුරුසියේ දී ජේසු තුමා පැවසූ හයවන වචනය | ක්‍රියා පොත යි. |

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශවල හිස්තැන තුළ දී ඇති පිළිතුර යොදා ගනිමින් සම්පූර්ණ කරන්න.**

( 3000, යාච්ඤාව, දූවිල්ලෙන්, සුදර්ශන, ඇදහිල්ල )

16. ජේසුස් වහන්සේ දින 40 ක් පාළුකරයේ සිටිමින් ........................................................................ කළ සේක.
17. දෙවියන් වහන්සේ ........................................................................................ මිනිසා නිර්මාණය කළ සේක.
18. උපන්දා පටන් කොරව සිටි පුද්ගලයා සුවය ලැබුවේ ........................................................ දොරටුව අසල දී ය.
19. කිතුනු ජීවිතයේ පදනම ........................................................................................................ යි.
20. පේදුරු තුමා කළ දේශනය අසා සභාවට එකතු වූ ගණන ........................................................................ කි.

'

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01. **කෙටි පිළිතුරු සපයන්න.**

(i) අද සමාජය තුළ දරුවන්ට එල්ල වන පීඩා 02 ක් ලියන්න.

(ii) ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා 02 ක් ලියන්න.

(iii) අවසාන රාත්‍රී භෝජන අවස්ථාවේ ජේසුස් වහන්සේ රොටී සහ කුසලාන සමාන කළේ කුමකටද?

(iv) ඔබට ඔබේ දෙමව්පියන් වෙනුවෙන් කළ හැකි දේවල් 02 ක් ලියන්න.

(v) අලුතින් ශ්‍රාවකයෙකු ලෙස තෝරා ගත් තැනැත්තා කවුද? ඔහු තෝරා ගත්තේ කෙසේද?

(vi) ජේසුස් වහන්සේ තම ඉගැන්වීම් සඳහා තෝරාගත් ස්ථාන 02 ක් ලියන්න.

(vii) මිනිසා විසින් දේව මැවිල්ල විනාශ කරන අවස්ථා 02 ක් ලියන්න.

(viii) කිතුනු දරුවෙක් ලෙස ඔබ සතු යහපත් ගුණාංග 02 ක් ලියන්න. (ල. 2x08=16)

02. (i) ජේසුස් වහන්සේ කුරුසියේ පැවසූ වදන් 02 ක් ලියන්න. (ල. 02)

(ii) එම වදන් වලින් ඔබට ඉගෙන ගත හැකි කරුණු 03 ක් ලියන්න. (ල. 03)

(iii) ඔබට වැරදි කරන අයට සමාව යදිමින් කරන යාච්ඤාවක් ලියන්න. (ල. 06)

03. (i) පෙන්තකොස්ත දින සිදු වූ විශේෂ සිදුවීම් 02 ක් ලියන්න. (ල. 02)

(ii) එම සිදුවීම් සිදු වූයේ කුමන දිවැසිවරයාගේ අනාගත වාක්‍ය අනුවද? එදින දේශනය සිදු කළේ කවුද? මේ අය රැස්ව සිටියේ කොහේ ද? (ල. 03)

(iii) ඔබ ශුද්ධාත්ම මඟ පෙන්වීම අයදිමින් යාච්ඤාවක් ලියන්න. (ල. 06)

04. (i) මුල් කිතුනු සභාවේ තිබූ ලක්ෂණ 02 ක් ලියන්න. (ල. 02)

(ii) "නාසරෙත්හි ජේසුස් වහන්සේගේ නාමයෙන් ඇවිදින්න" මෙම ප්‍රකාශය කළේ කවුද? කාටද? කොහේදී ද? (ල. 03)

(iii) මෙම සුව කිරීම තුළ ඔබට ඉගෙන ගතහැකි දේවල් 03 ක් ලියන්න. (ල. 06)

05. (i) පහත ප්‍රකාශයේ හිස්තැන් පුරවන්න.

ඔබේ සතුරන්ට ........................................ කරන්න. ඔබ පීඩා කරන්නන් උදෙසා ......................... කරන්න. (ල. 02)

(ii) ස්වාමීන්ගේ යාච්ඤාව තුළ කමාව පිළිබඳ ඇතුළත් වැකිය ලියන්න. (ල. 03)

(iii) ඔබේ පන්තියේ අවශ්‍යතා ඇති යහළුවෙකුට යෙහෙළියකට කළ හැකි උපකාර 03 ක් ලියන්න. (ල. 06)

06. (i) බයිබලයේ සඳහන් "රන් අණ" ලියන්න. (ල. 02)

(ii) ජේසු තුමා විසූ සමාජය තුළ ප්‍රතික්ෂේප කළ ජන කොට්ඨාස 03 ක් ලියන්න. (ල. 03)

(iii) ඔබට සතුරුකම් කරන අය වෙනුවෙන් ඔබ කරන දේවල් 03 ක් ලියන්න. (ල. 06)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( 3 ) 02. ( 2 ) 03. ( 1 ) 04. ( 2 ) 05. ( 3 ) 06. (X) 07. (✓) 08. (✓) 09. (X) 10. (✓)

11. දෙවියන් වහන්සේ 12. තෝමස් ය. 13. රොටී කැඩීම. 14. ක්‍රියා පොතයි.
15. සියල්ල නිම විය. 16. යාච්ඤා 17. දූවිල්ලෙන් 18. සුදර්ශන
19. ඇඳහිල්ල 20. 3000

## II කොටස

01. (i) දුප්පත්කම / යුද්ධය / විවිධ වධ හිංසා / මත්ද්‍රව්‍ය ඇබ්බැහි වීම / මව පියා විදේශ ගත වීම ..........

(ii) ♦ ගල් පාන් ගෙඩියක් වන්නට අණ කිරීම. ♦ යක්ෂයාට නමස්කාර කිරීම. ♦ දේව මාළිගාවේ කොත මුදුනින් පහතට පැනීම.

(iii) ♦ රොටී - ශරීරය ♦ කුසලාන - රුධිරය.

(iv) කීකරු වීම / රැකබලා ගැනීම / උපකාර කිරීම / ප්‍රිය වදනින් කතා කිරීම.

(v) මත්තියස් / දාදු දැමීමෙන්.

(vi) කඳු මුදුන් / මිටියාවත් / මුහුදු වෙරළ

(vii) ගස් කැපීම / වායු දූෂණය / පරිසර දූෂණය /ජල දූෂණය

(viii) කීකරුකම / ප්‍රේමය / නිහතමානීකම / පරාර්ථකාමීකම / කරුණාව. (ල. 2x08=16)

02. (i) ♦ පියාණෙනි ඔවුන්ට කමා වුව මැනව. ඔවුන් කරන දේ ඔවුහු නොදනිති. ♦ ස්ත්‍රීය මෙන්න ඔබේ පුත්‍රයා මෙන්න ඔබේ මෑණියෝ ය. ♦ සියල්ල නිම විය. (ල. 02)

(ii) වැරදි කරන අයගේ වැරදි අමතක කිරීම. / ඔවුන්ට කරුණාව දැක්වීම. / සමාව දීම. / මව පියා රැක බලා ගැනීම. / භාරවන කාර්යයන් ඉටු කිරීම. (ල. 03)

(iii) ශිෂ්‍ය පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 06)

03. (i) සැඩ සුළඟක් හැමීම. / ගිනිදළු වැනි දිව් / අන්‍ය භාෂා කථා කිරීම. (ල. 02)

(ii) ♦ ජොවෙල් දිවැසිවරයා ♦ පේදුරු තුමා ♦ ජෙරුසලමේ (ල. 03)

(iii) ශිෂ්‍ය පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 06)

04. (i) ඉගැන්වීම / සහභාගීකම / රොටී කැඩීම / යාච්ඤාව / සියල්ල පොදුවේ තබා ගැනීම. (ල. 02)

(ii) පේදුරු තුමා / උපන්දා පටන් කොරව සිටි පුද්ගලයාට සුදර්ශන දොරටුව අසලදී. (ල. 03)

(iii) ♦ සුවය ශුද්ධාත්මයාණන්ගෙන් ලැබෙන බව. ♦ මිල මුදලට සුවය දිය නොහැකි බව. ♦ ශ්‍රාවකයින් සුභාරංචිය ප්‍රකාශ කළ බව. ♦ ජේසු තුමා අදහා ගැනීම තුළ සුවය ලැබෙන බව. (ල. 06)

05. (i) ♦ ප්‍රේම ♦ යාච්ඤා (ල. 02)

(ii) අපට වැරදි කරන අයට අපකමා කරන්නාක්මෙන් අපේ වැරදි වලට ද කමා වුව මැනව. (ල. 03)

(iii) ශිෂ්‍ය පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 06)

06. (i) අනුන් බට යමක් කරනවාට ඔබ කැමතිද? ඔබත් ඔවුන්ට ඒදේම කරන්න. (ල. 02)

(ii) කාන්තාවන්, රෝගීන්, අයකැමියන්, ළදරුවන්, සමාරිතයන්. (ල. 03)

(iii) ශිෂ්‍ය පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 06)